# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1422/22 – 2005 දෙසැම්බර් 08 වැනි බ්‍රහස්පතින්දා – 2005.12.08

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස : (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

### නිවේදනය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 වැනි ව්‍යවස්ථාවේ (1)(අ) වැනි අනු ව්‍යවස්ථාව යටතේ මා වෙත පැවරී ඇති බලතල ක්‍රියාත්මක කරමින් අමාත්‍යවරයන් හා අමාත්‍යාංශ ගණනත්, එකී අමාත්‍යවරයන්ට විෂයයන් හා කාර්යයන් සහ දෙපාර්තමේන්තු හා ව්‍යවස්ථාපිත ආයතන පැවරීමත් මා විසින් නිශ්චය කර ඇති හෙයින්,

විවිධ අමාත්‍යවරයන් භාරයේ පවත්නා විෂයයන් හා කාර්යයන් සහ දෙපාර්තමේන්තු හා ව්‍යවස්ථාපිත ආයතන මෙම නිවේදනයේ දිනයේ දී මෙහි පහත දැක්වෙන උපලේඛනයෙහි සඳහන් පරිදි පවත්නා බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

යම් අමාත්‍යවරයෙකුට නිශ්චිතව පවරනු නොලැබූ සියලුම විෂයයන් හා කාර්යයන් සහ දෙපාර්තමේන්තු හා ව්‍යවස්ථාපිත ආයතන ජනාධිපති වශයෙන් මා භාරයේ තවදුරටත් පවතිනු ඇත.

මහින්ද රාජපක්ෂ,<br>
ජනාධිපති.

2005 දෙසැම්බර් මස 08 වැනි දින,<br>
ජනාධිපති කාර්යාලය,<br>
කොළඹ 01.

### උපලේඛනය

### ආගමික කටයුතු අමාත්‍ය

බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුව

ක්‍රිස්තියානි ආගමික කටයුතු දෙපාර්තමේන්තුව

හින්දු ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව

මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව

සදාචාර සම්පන්න සමාජයක් ගොඩනැගීම සඳහා ආගමික වටිනාකම් ජනතාව තුළ වර්ධනය කරනු පිණිස ප්‍රතිපත්ති හා වැඩසටහන් සම්පාදනය සහ ක්‍රියාත්මක කිරීම

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 10 හා 14(1)(ඉ) වැනි වගන්ති මගින් පවරා දී ඇති සියලුම ආගම් සඳහා වන අයිතිවාසිකම් සුරක්ෂිත කරමින් 9 වැනි ව්‍යවස්ථාවෙහි විධිවිධාන සලසා ඇති පරිදි බුද්ධ ශාසනය සුරක්ෂිත

## රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍ය

| *I වැනි තීරුව*<br>*දෙපාර්තමේන්තු හා ව්‍යවස්ථාපිත ආයතන* | *II වැනි තීරුව*<br>*විෂයයන් හා කාර්යයන්* |
|---|---|
| දිස්ත්‍රික් ලේකම් කාර්යාල | රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු පිළිබඳ ප්‍රතිපත්තීන්, සැලසුම් හා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම |
| ප්‍රාදේශීය ලේකම් කාර්යාල | වෙනත් අමාත්‍යාංශයන්ට නිශ්චිතව පවරා නොමැති විෂයයන් සම්බන්ධයෙන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලයන්හි සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයන්හි නිලධාරීන් පිළිබඳ පොදු වශයෙන් අධීක්ෂණය හා මෙහෙයවීම |
| රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව | රජයේ සියළුම විශ්‍රාම වැටුප් ක්‍රම |
| ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය | පාරිතෝෂික දීමනා හා වන්දි මුදල් ගෙවීමේ ක්‍රම |
| විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව | අර්ථ සාධක අරමුදල් |
| ආයතන අධ්‍යක්ෂකවරයාගේ දෙපාර්තමේන්තුව | ඒකාබද්ධ සේවාවන් පරිපාලනය කිරීම |
| ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂවරයාගේ දෙපාර්තමේන්තුව | පරිපාලන ප්‍රතිසංස්කරණ |
| ශ්‍රී ලංකා ඉංජිනේරු සේවා මණ්ඩලය | ආයතන සංග්‍රහය යටතේ වන කාර්යයන් |
| ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥ සේවා මණ්ඩලය | අනිවාර්ය රාජ්‍ය සේවා පනත පරිපාලනය කිරීම |
| ශ්‍රී ලංකා තාක්ෂණ සේවා මණ්ඩලය | රාජ්‍ය සේවාව පරිපාලනය කිරීමට අදාළ වන ප්‍රතිපත්ති ණය සහන සහාවට අදාළ කටයුතු |
| ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවා මණ්ඩලය | නිලධාරිවාදය බැහැර කරලීම |
| රාජ්‍ය සේවා කළමනාකරණ සංවර්ධන අධිකාරිය | ශ්‍රී ලංකා ඉංජිනේරු සේවා මණ්ඩලය, ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවා මණ්ඩලය, ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥ සේවා මණ්ඩලය හා ශ්‍රී ලංකා තාක්ෂණ සේවා මණ්ඩලයට අදාළ පරිපාලන හා පිරිස් කළමනාකරණ කාර්යයන් |
| අග්‍රහාර රක්ෂණ ක්‍රමය | රජයේ නිල නිවාස වෙන් කර දීම හා පරිපාලනය කිරීම |
| | රාජ්‍ය උත්සව |
| | උප්පැන්න, විවාහ සහ මරණ ලියාපදිංචි කිරීම |
| | ඔප්පු හා වෙනත් වාණිජ ලේඛන ලියාපදිංචි කිරීම |
| | ඉඩම් හිමිකම් හා නොතාරිස්වරුන් ලියාපදිංචි කිරීම |
| | උඩරට විවාහ හා දික්කසාද |
| | මුස්ලිම් විවාහ හා දික්කසාද |
| | ළමයින් දරුකමට හදා වඩා ගැනීම් හා උසාවිවලින් නිකුත් කෙරෙන නියෝග ලියාපදිංචි කිරීම සහ ළමයින් දරුකමට හදාවඩා ගැනීමේ ආඥා පනත |

| *I වැනි තීරුව*<br>*දෙපාර්තමේන්තු හා ව්‍යවස්ථාපිත ආයතන* | *II වැනි තීරුව*<br>*විෂයයන් හා කාර්යයන්* |
|---|---|
| | ලිඛිත බලපැවරුම් අධිකාරීන් ලියාපදිංචි කිරීම |
| | ඇටෝර්නි බලය ලියාපදිංචි කිරීම |
| | 1957 අංක 36 දරන තෑගි තරඟ පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම |
| | 1957 අංක 36 දරන තෑගි තරඟ පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම |
| | නිවාඩු ආඥා පනත පරිපාලනය කිරීම |
| | අග්‍රහාර රක්ෂණ ක්‍රමය පරිපාලනය කිරීම |

**ජනමාධ්‍ය හා තොරතුරු අමාත්‍ය**

| | |
|---|---|
| ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව | තොරතුරු සහ ජනමාධ්‍ය පිළිබඳ ප්‍රතිපත්තීන්, සැළසුම් සහ වැඩ සටහන් ක්‍රියාවට නැංවීම |
| ශ්‍රී ලංකා රූපවාහිනි සංස්ථාව | ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවට අදාළ කටයුතු |
| සීමාසහිත ස්වාධීන රූපවාහිනී සේවය | ප්‍රවෘත්ති සාකච්ඡා සංවිධානය කිරීම ඇතුළුව නිල ප්‍රවෘත්ති ජනමාධ්‍යවලට නිකුත් කිරීම. |
| ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව | ප්‍රචාරක කටයුතු සම්බන්ධයෙන් වෙනත් රජයේ දෙපාර්තමේන්තුවලට උපදෙස් දීම |
| ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපතිගේ දෙපාර්තමේන්තුව | පොදුවේ ශ්‍රී ලංකාව ගැනත් පෞද්ගලික වශයෙන් විමසීම් කරන්නන්ටත් තොරතුරු නිකුත් කිරීම |
| රාජ්‍ය මුද්‍රණ සංස්ථාව | රජයේ දෙපාර්තමේන්තුවලට තොරතුරු සැපයුම හා ප්‍රචාරක කටයුතු |
| ශ්‍රී ලංකා මුද්‍රණකරුවන්ගේ ආයතනය | විදෙස්හි පිහිටි ශ්‍රී ලංකා දූත මණ්ඩලවලට අවශ්‍ය තොරතුරු හා ප්‍රචාරක ද්‍රව්‍ය සැපයීම |
| සීමාසහිත ලංකාවේ එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම | ප්‍රකාශනවලට අදාළ ජාත්‍යන්තර ගිවිසුම |
| සැලසිනේ රූපවාහිනී ආයතනය | දෙපාර්තමේන්තු ප්‍රකාශන හැර රජයේ වෙනත් ප්‍රකාශන අලෙවිය, ගබඩා කිරීම සහ නිකුත් කිරීම |
| ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලය | ප්‍රවෘත්ති චිත්‍රපට හා වාර්තාමය චිත්‍රපට නිෂ්පාදනය හා ප්‍රදර්ශනය කිරීම |
| | වාණිජ ගුවන් විදුලි ප්‍රචාරය සහ විදේශීය විකාශනයන් ඇතුළුව ගුවන් විදුලි ප්‍රචාරක කටයුතු |
| | ගුවන් විදුලි ඉංජිනේරු විද්‍යාත්මක කටයුතු |
| | රූපවාහිනී සේවා |
| | ශ්‍රාවක පර්යේෂණ කටයුතු |
| | ගුවන් විදුලි ප්‍රචාරය පිළිබඳ ප්‍රකාශන |
| | පුවත්පත් ආඥාපනත පරිපාලනය කිරීම |

| *I වැනි තීරුව* දෙපාර්තමේන්තු හා ව්‍යවස්ථාපිත ආයතන | *II වැනි තීරුව* විෂයයන් හා කාර්යයන් |
|---|---|
| | නිමි ඇඳුම් ඇතුළු සියලුම රෙදිපිළි නිෂ්පාදනයන් අපනයනය ප්‍රවර්ධනය කිරීම හා නියාමය කිරීම. |
| | පේෂ කර්මාන්තයට අදාළ ද්විපාර්ශවීය ගිවිසුම් පරිපාලනය කිරීම. |
| | නිමි ඇඳුම් හා රෙදිපිළි කර්මාන්තය සංවර්ධනය සඳහා ශ්‍රමිකයින් පුහුණු කිරීම. |
| | රෙදිපිළි පංගු මණ්ඩල යෝජනා ක්‍රමය පරිපාලනය කිරීම. |
| | අත්යන්ත්‍ර පේෂ කර්මාන්ත සංවර්ධනය කිරීම. |

## ස්වදේශ කටයුතු අමාත්‍ය

| | |
|---|---|
| දිස්ත්‍රික් ලේකම් කාර්යල | රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යවරයා විමසා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල වැඩ කටයුතු අධීක්ෂණය කිරීම. |
| ප්‍රාදේශීය ලේකම් කාර්යාල | වෙනත් අමාත්‍යංශයන්ට නිශ්චිතව පවරා නොමැති විෂයයන් සම්බන්ධයෙන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලයන්හි නිලධාරීන් පිළිබඳ පොදු වශයෙන් අධීක්ෂණය හා මෙහෙයවීම. |
| | තානායම් හා සංචාරක බංගලා සම්බන්ධ පොදු අධීක්ෂණය. |

## කෘෂිකර්ම සංවර්ධන අමාත්‍ය

| | |
|---|---|
| කෘෂිකර්ම දෙපාර්තමේන්තුව | කෘෂිකර්ම සංවර්ධනය පිළිබඳ ප්‍රතිපත්ති, සැලසුම් හා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම |
| අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව. | කෘෂිකාර්මික භෝග විවිධාංගීකරණය |
| ජාතික කෘෂිකාර්මික විවිධාංගීකරණය හා ජනාවාස අධිකාරිය ( හදබිම) | කෘෂි නිෂ්පාදන වැඩිදියුණු කිරීම. |
| ජාතික පොහොර ලේකම් කාර්යාලය | කෘෂිකාර්මික අධ්‍යාපනය |
| ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාව | පස සංරක්ෂණ පනත පරිපාලනය කිරීම හා ක්‍රියාත්මක කිරීම. |
| හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා අභ්‍යාස ආයතනය | කෘෂිකර්ම පර්යේෂණ හා ව්‍යාප්ති සේවා |
| එළවළු සංවර්ධන මණ්ඩලය | අපනයන කෘෂිකර්ම බෝග සංවර්ධනය |
| පළතුරු සංවර්ධනය මණ්ඩලය | සූක්ෂම ජලපද්ධති වාරිකුම සංවර්ධනය කිරීම. |
| පශ්චාත් අස්වනු තාක්ෂණ ආයතනය | පැළෑටි නිරෝධායනය. |